**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

# වී අලෙවි මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ ගිණුම් සහකාර සහ කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගිණුම් සහකාර - තනතුරු 01

**(අ) බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්**

ගිණුම්කරණ විෂයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**(ආ) මාසික වැටුප් පරිමාණය :**

MA 2-1-2025 - රු. (50,540 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1,190 - 87,710)
(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

## කළමනාකරණ සහකාර - තනතුරු 10

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**බඳවා ගැනීමේ සුදුසුකම්**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

- සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.
- නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහ (05) ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**(ඇ) මාසික වැටුප් පරිමාණය**

MA 1-1-2025 රු. (46,220 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1,190 - 83,390)
(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

**පොදු කරුණු**

- වයස් සීමාව අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- මෙම තනතුරු ස්ථිර වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා දායකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තනතුරට ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.
- දැනට රාජ්‍ය සේවයේ, රාජ්‍ය ව්‍යාපාර සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අනෙකුත් රාජ්‍ය ආයතන වල සේවයේ නියුක්ත අයවලුන් දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලේඛන වල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ඇතුළත්ව 2026.01.26 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම / සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

**සභාපති,**
**වී අලෙවි මණ්ඩලය,**
**නිවාස මහ ලේකම් ගොඩනැගිල්ල, 6 වන මහල,**
**සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.**